**ජාඇල නගර සභාව - 2020**

**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ජාඇල නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාඇල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් විස්තරාත්මක කළමනාකරණ වාර්තාවේ පහත අංක යටතේ සඳහන් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.
1.2.1(ඇ), 1.2.2, 1.2.3, 1.2.4, 1.2.5(අ), 1.2.6, 2.2.2, 3.2(ආ) හා 3.4(ආ)

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක 18.7 හා LGD/10A/ 4/න.ගි./2019 අංක දරන පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති ලිපිය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.<br>(ආ) අංක 6.3 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.<br>(ඇ) අංක 18.4 ප්‍රකාරව වාර්තා කරන කාල පරිච්ඡේදයේ ආරම්භය වූ 2020 ජනවාරි 01 දිනට සභාවේ ස්ථාවර වත්කම් වගකීම් ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි.<br>(ඈ) අංක 9.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම්වලින් වර්ෂයේ කළ ගෙවීම්, අතිරික්තයේ හඳුනාගත් ප්‍රදාන ලෙස අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ සටහන් කළ යුතු අතර ක්ෂය කිරීම් ගණනය කළ පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ජර්නල් සටහනක් මඟින් සටහන් අංක 05 යටතේ අයභාරයක් ලෙස දැක්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු හා ලැබිය යුතු රු.16,438,272 ක් වූ ප්‍රාග්ධන ආධාර මුදල් එසේ ගිණුම්ගත නොකොට පොදු තැන්පත් ගිණුම හරහා ලැබීම් ගෙවීම් ගිණුම් ගත කොට තිබුණි. | 2021 වර්ෂයේ ඉදිරිපත් කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ප්‍රමිති උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුළත් EG 3.2 ප්‍රකාරව පරිදි පාරවල් සහ බෝක්කු සහ වෙනත් යටිතල පහසුකම් අයිතමයන් දේපල පිරියත උපකරණ යටතේ වෙනස් ගිණුම්කරණ ක්ෂේත යටතේ ගිණුම්ගත කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ රු.29,567,827 ක් වැයකර සංවර්ධනය කළ පාරවල්, බෝක්කු හා කාණු එසේ ගිණුම්ගත කර නොතිබුණි. | කර්මාන්ත විෂයන් පොදු තැන්පත් ගිණුමට බිල්කර තිබූ බැවින් මෙම වරද සිදුවී ඇති බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | ප්‍රමිති උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුලත් EG 3.2 ප්‍රකාරව කෙරීගෙන යන යම් ප්‍රාග්ධන වැඩ වෙතොත් ඒවා දේපල පිරියත හා උපකරණ උපලේඛනයේ වෙනම ප්‍රභේදයක් ලෙස පෙන්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන කර්මාන්ත 13 ක වටිනාකම වූ රු.9,303,837 ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ සිට ඇතුළත් කිරීමට පියවර ගනු ලබන බව දන්වමි. | |
| (උ) | අංක 9 හා 10 ප්‍රකාරව හුවමාරු ගනුදෙනුවලින් වන අයභාරය හා හුවමාරු නොවන ගනුදෙණුවලින් වන අයභාරය වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද සභාවේ සියළුම ආදායම් රු.154,960,889 ක් හුවමාරු ගණුදෙනුවලින් ලද අයභාරය ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ සිට ඇතුළත් කිරීමට පියවර ගනු ලබන බව දන්වමි. | |

### 1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිරිපත් කළ අංක 3.2 ප්‍රතිපත්තිය යටතේ පරිගණක මෘදුකාංග වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගන්නා බව සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.1,497,500 ක් වූ මානව සම්පත් සඳහාවූ පරිගණක මෘදුකාංගය වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති නිවැරදි ක්ෂය අනුපාතයක් යටතේ ක්ෂය කළ යුතුවේ. |
| (ආ) | අංක 3.5 ප්‍රතිපත්තිය යටතේ දක්වා තිබුණු පරිදි ස්ථාවර වත්කම් කාණ්ඩගත කිරීම හා ක්ෂය කිරීම සිදුකර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබීම නිසා ක්ෂය වටිනාකම් ප්‍රවර්තන වර්ෂය තුල ගණනය කර ලේඛනගත කර නොමැති බව දන්වමි. | |

### 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ණය පදනම මත ලබාදී තිබුණු රු.12,998,400 ක් වූ කම්පැක්ටර් රථය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී මුද්දර ගාස්තු ආදායමින් අඩුකර තිබුණු රු.1.810,000 ක් සඳහා අදාල ණය ගිණුම හර කර නොතිබීමෙන් ණය ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | ත්‍රී රෝද රථ 02 ක් මිලදී ගැනීම සඳහා 2017 වර්ෂයේ රු.2,000,000 ක් ණයහිමි වෙන්කර 2018 වර්ෂයේ රු.1,499,900 ක් වැයකර ඒවා මිලදී ගැනීමේදි ණයහිමි ගිණුම හර නොකිරිම හේතුවෙන් ණයහිමියෝ ශේෂය රු.2,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ දී නිවැරදි කිරීමට සටහන් කරගන්නා ලද බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | නිරවුල් කරන ලද රු.414,515 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ 4 ක් , අවලංගු කරන ලද ව්‍යාපෘතියකට අදාල රු.500,000 ක ණයහිමි ශේෂයක් හා ගෙවිය යුතු මුදලට වඩා වැඩියෙන් දක්වා තිබු රු.6,426,450 ක් වූ ණයහිමි ශේෂ 13 ක් කර්මාන්ත ණයහිමි ශේෂය තුළ දක්වා තිබිම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමියෝ රු.7,340,965 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ගිණුම් ගත කිරීමේ දී මුළු මුද්දර ගාස්තු වටිනාකමින් වාහන ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අඩුකර ගත් ණය වාරික වටිනාකම වන රු.2,896,000 ක් අඩු කිරීමෙන් පසු ශුද්ධ මුදල ආදායමට ගිණුම්ගත කර තිබීමෙන් එම වටිනාකමින් වෙනත් ආදායම් අඩුවෙන් හා ණයහිමියන් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | 2021 වර්ෂයේ දී නිවැරදි කිරීමට සටහන් කරගන්නා ලද බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | සභාවේ ස්ථාවර තැන්පතුවලින් රු.15,823,669 ක් ජංගම ගිණුමට මැරු කර එයින් නැවත ආයෝජනය කළ රු.823,669 ක් ආයෝජන ක්‍රියාකාරම්වලින් ජනිතවූ මුදල් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබූ අතර නැවත ආයොජනය කර තිබූ මුදල ජංගම නොවන ආයොජන ලෙසද ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු. 1,949,338 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 41,081,341 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---------------------

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් | | |
| සමාලෝචිත වර්ෂයේදී රු. 1,177,685 ක් වූ වරිපනම් ඒකක 101 ක් ලිඛිත ඉල්ලීමක් නොමැතිව කපා හැරිමට කටයුතු කර තිබූ අතර වරිපනම් ලේඛනයේ අංක 01 හා 09 කොට්ඨාශයට අයත් වානිජ වරිපනම් ඒකක 192 කින් ව්‍යාපාර 94 ක, ව්‍යාපාර හෝ බලපත්‍ර ගාස්තුවක් අය කර නොතිබුණි.ජනාකීර්ණ ප්‍රදේශයක් වූ මෙම කොට්ඨාශ ආශ්‍රිතව පමණක් හිස් ඉඩම් ඒකක 774 ක් | අයකල ඇති ගාස්තු ප්‍රමාණය අඩුවී ඇති බව දන්වමි. | නිවැරදි ගාස්තු අය කළ යුතුවේ. |

දක්වා වාර්ෂික වරිපනම් ගාස්තුව ලෙස රු. 30 ක අඩු මුදලක් අය කර තිබුණි.

(ආ) කුලී

-----

| | | |
|---|---|---|
| බස්නාහිර පළාත්,පළාත් පාලන කොමසාරිස්ගේ 2016 දින රහිත LGD/13/2016 චක්‍රලේඛය අනුව, වත්කම් අතුරු බදු දීමේදී මාසික බදු කුලිය මෙන් 60 ගුණයකට නොඅඩු වටිනාකමක් අයකළ යුතු වුවද සභාවට අයත් කඩ කාමර 35 ක් අතුරු බදුදීම සඳහා කැමැත්ත ප්‍රකාශ කර තිබියදී හා ඒ සඳහා අවශ්‍ය වන ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබියදී අතුරු බදුදීමේ ක්‍රමවේදය 2020 සැප්තැම්බර් 22 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.ඒ හේතුවෙන් සභාවට අහිමිවූ ආදායම රු.1,470,576 ක් විය.මෙම ආදායම් අහිමිවීම පැරණි කඩ කුලිය මත ගණනය කරන ලද අතර නව තක්සේරුව 2018 මැයි 25 දින ලැබී තිබුණද 2020 සැප්තැම්බර් 22 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | අතුරු බදු කරුවන් විසින් කඩ කාමර අතුරු බදු පවරා ගැනිමට කටයුතු කරන ලෙස ලිපි මඟින් දන්වා යැවුවද ඔවුන් ඊට ඉදිරිපත් නොවූ අතර මේ වනවිට ඒ සඳහා ඉදිරිපත් වී ඇති දෙදෙනකුට පමණක් අතුරු බදු පැවරුම සිදු කර ගිවිසුම් ගතවී ඇති බව දන්වමි. | නව තක්සේරුව අනුව අනුමත පරිදි පැවරීම් කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

--------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතෘ සායන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ආයතනයක් සමඟ 2011 ජුනි 08 දින රු.15,079,593 ක මුදලකට ගිවිසුම්ගතව 2011 අගෝස්තු 16 දින වැඩ ආරම්භ කර තිබුණද සභාවේ පැවති අර්බුදකාරි තත්ත්වය හේතුවෙන් අත්තිවාරම පමණක් ඉදිකර ඉතිරිවැඩ අතරමඟ නතර කර තිබුණි.ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා සියයට 20 ක අත්තිකාරම් මුදලක් ලෙස රු.3,015,919 ක් ගෙවා තිබු නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ප්‍රකාරව වැඩ සඳහා යම් අත්තිකාරම් මුදලක් ගෙවීමේදී ලබා ගත යුතු පිළිගත හැකි සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.ඒ අනුව වැඩ අතර මඟ නතර කර තිබියදී | මේ සම්බන්ධව ඉදිරියේ දී කටයුතු කිරීමට පියවර ගනු ලබන බව දන්වමි. | වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

කොන්ත්‍රාත්තුවේ කළ වැඩ වටිනාකම වූ රු.2,291,530 ක ගෙවූ අත්තිකාරම් මුදලට වඩා රු.724,389 ක් වැඩි වූ හෙයින් අත්තිකාරම් සඳහා ඇපකරයක් ලබා ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 අනවසර ඉදිකිරීම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කෙලින්වීදිය අංක 124 හි ඉදිකරමින් පැවති තෙමහල් ගොඩනැගිල්ල මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග දෙකකට මැදිව පිහිටා තිබූ අතර කොළඹ පාර මධ්‍යයේ සිට දුර අඩි 45 ක් හා නව කොළඹ මාර්ගයේ මධ්‍යයේ සිට අඩි19 අඟල් 6 ක් දුරකින් පිහිටා තිබුණි. ඒ අනුව මෙම ගොඩනැගිල්ල අදාල සීමා උල්ලංඝනය වන අයුරින් ඉදි කර තිබූ බව අනාවරණය වූ අතර එහිවූ අවුරුදු 20 කට වඩා පැරණි බිම්මහල් ගොඩනැගිල්ලේ වූ කඩකාමර 7 ක් වරිපනම් සඳහා ලේඛනගතව ඇති බවද අනාවරණය විය.2 වන මහල සඳහා කණු හා ස්ලැබ් යෙදීමෙන් පසු ඉදිරිපත් කර තිබූ ගොඩනැගිලි අයදුම්පත්වල අඩුපාඩු දක්වා ඇතත් මේ දක්වා නිවැරදි කරගෙන නොමැති හෙයින් මෙම අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් නගර සහා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ගත යුතු ක්‍රියා මාර්ග සභාව විසින් පැහැර තිබුණි. | පරීක්ෂා කරමින් පවතින බව දන්වා ඇත. | නිත්‍යානුකූල පියවරගත යුතුවේ. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ සේවයේ නියුතුව සිටි නිලධාරියෙකුට 2020 ජනවාරි 01දින සිට ජා-ඇල ප්‍රාදේශීය සභාව වෙත ස්ථාන මාරු ලබාදී තිබූ අතර අවස්ථා 09 කදී ඔහු විසින් ලබාගෙන තිබූ රු.205,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිමයන්, සේවයෙන් මුදාහැරීමට ප්‍රථම පියවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර අදාල අතුරු අග්‍රිම 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.ලේකම්ගේ 2019 දෙසැම්බර් 31 දිනැති ලිපිය ප්‍රකාරව නිලධාරියා සන්තකයේ පැවති භිහ රාජකාරි විස්තර හා අදාල ලිපි ලේඛන විධිමත්ව භාර ගැනීමකින් තොරව අදාල නිලධාරියා මුදා හැර | මෙම නිලධාරියා විසින් ලබා ගත් නොපියවූ අත්තිකාරම් පියවා ගැනීමට උපදෙස් පතා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලිපි යවා ඇති බව දන්වමි. | පියවා ගැනීමට හා නිරවුල් කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

තිබුණි. තවද එම නිලධාරියා විසින් මෙහෙයවා තිබූ, භාණ්ඩ සැපයුම් විෂයට අදාලව හඳුනාගත් අයිතම 27ක් වෙනුවෙන් නොගෙවූ බිල්පත් ආශ්‍රිතව ගැටළු මතුවී තිබූ අතර ඒ හේතුවෙන් ඒවා 2021 මාර්තු 31 දින දක්වා ගෙවීම් කර නිරවුල් කිරීමට නොහැකිවී තිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාල කටයුතු පරිගණකගත කිරීමේ අරමුණින් රු.4,575,000 ක් වැයකර වරිපනම් ගෙවීම් හා ආදායම් කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංගයක් 2019 සැප්තැම්බර් 17 දින මිලදී ගෙන තිබූ අතර අන්තර්ජාලීය වෙබ් අඩවියක් හරහා වරිපනම් ගෙවීමේ පද්ධති පහසුකම සඳහා රු.650,000 ක ගෙවීමක් සිදුකර තිබුණද 2020 සැප්තැම්බර් 30 දින වන විටත් එහි ප්‍රගතියක් නොතිබුණි. ගිවිසුම් ප්‍රකාරව ජංගම දුරකථන යෙදවුම නිර්මාණය කිරීම,කෙටි පණිවිඩ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් පූර්ව නිරීක්ෂණයන් සිදුකර අවශ්‍ය අඩුපාඩුකම් හඳුනාගෙන නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගෙන නොතිබූ අතර ඉදිරි වසර 05 සඳහා මෘදුකාංග පද්ධතියට අදාළව, අලෙවියෙන් පසු සේවා සැපයීම් පිළිබඳ ගිවිසුමකට එළඹ නොතිබුණි.මෙම මෘදුකාංග පද්ධතිය පූර්ණ ක්‍රියාකාරිත්වයට පත්කර නොතිබියදී, වැටුප් හා මානව සම්පත් කළමනාකරණය සඳහා මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීමට ගිවිසුම්ගතවී තිබූ අතර ගිවිසුම්ගත වටිනාකමින් සියයට 50 ක් වන රු.1,497,47 ක් 2020 ජූනි 29 දින ගෙවීම් කර තිබුණි. පෙර මිලදී ගත් මෘදුකාංග පද්ධතියේ අඩුපාඩු නිවැරදි කර ගැනීමකින් තොරව, නව මෘදුකාංග කළමනාකරණ පද්ධතියක් සඳහා ගිවිසුම්ගත වීම ප්‍රශ්නගත විය. | ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණින් මානව සම්පත් කළමනාකරණ පැකේජයද කඩිනමින් ස්ථාපිත කර ක්‍රියාත්මක කරවීමට පියවර ගන්නා ලද බව දන්වමි. | අඩුපාඩුකම් හඳුනාගෙන නිවැරදිව ක්‍රියාත්මක කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොඩි ඇල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම සඳහා අදියර 06 ක් යටතේ සමිති දෙකක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර මෙම පැති බැම්ම අඩි 853 ක් දිගින් ද පොළව මට්ටමින් ඉහලට අඩි 2 ක් අඩි 7 අඟල් 6 ක් හා පොළව මට්ටමින් යටට කොන්ක්‍රීට්වලින් ඉදිකිරීම් සිදු කර රු.14,156,879 ක් ගෙවීම් කර තිබුණි. | පැති බැම්ම අවසානයේ ඇති කළුගල් බැම්ම සඳහා පමණක් කොන්ක්‍රීට් ලෙස ගෙවීම සිදුවී ඇති අතර නිවැරදි මිනුම් වාර්තා පිළියෙල නොකිරීම හේතුවෙන් 3'7'' දිග ප්‍රමාණයක් වැඩිපුර ගෙවීම | නිවැරදි මිණුම් ලබාගෙන ගෙවීම් කළ යුතු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධානවලට අනුව කටයුතු කළ යුතුවේ. |

පොළව යට කොටසේ වූ පියවර 4 කින් පියවර 3 ක් 2021 ජනවාරි 19 දින භෞතිකව කැනීම් සිදු කරන ලද අතර අවසන් ගෙවීම් වාර්තා හා භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ ප්‍රමාණයන් අතර යෙදූ කොන්ක්‍රීට් ප්‍රමාණයේ වෙනස කියුබ් 95.18 ක් වූයෙන් කොන්ක්‍රීට් සඳහා වැඩිපුර ගෙවූ මුදල රු.4,102,304 ක් විය.මෙහි IV සහ V අදියරයන් සඳහා මිනුම් ගැනීමකින් තොරව එක සමාන මුදලක් සමිති 02 ක් සඳහා ගෙවීම් කර තිබූ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 විධි විධානවලින් බැහැරව සමිති 02 කට රුපියල් මිලියන 2 ඉක්මවා කොන්ත්‍රාත් ලබාදී තිබුණි.

සිදුවී ඇති බව දන්වමි.